**උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ((SCDP) - 2022**

**------------------------------------------------------------------**

උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (IDA) අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි 5428-LK අංක දරන ණය ගිවිසුමේ සහ 2016 ජූලි 20 දින එළඹි 5800-LK අංක දරන සංශෝධිත ණය ගිවිසුමේ II (ආ)(3) වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (SCDP) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සහභාගීත්ව නගර කළාපවල තෝරාගත් නාගරික සේවා හා පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 34,912.48 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 257.08 ක් වන අතර ඉන් රු.මිලියන 27,507 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 202 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (IDA) එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන එ.ජ.ඩොලර් මිලියන 55 කට සමාන රු.මිලියන 7,405.48 ක මුදල ශ්‍රී ලංකා රජයෙන් මූල්‍යනය කිරීමට එකග වී තිබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 දින ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් 31 දින වන විට නිමකිරිමට නියමිතව තිබුණි. තවද, 2016 ජූලි 20 දිනැති අංක 5800-LK දරන ගිවිසුමට අනුව ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (IDA) **විසින් යාපනය නගරය සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා** එ.ජ.ඩොලර් මිලියන 55 කට සමාන රු.මිලියන 8,250 ක මුදල් ප්‍රතිපාදන ලබා දීමට එකග විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය 2022 ජුනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතිය නිම කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වන ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2 ඡේදයේ විස්තර කෙරෙන කරුණු මත මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 ව්‍යාපෘති අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් ව්‍යාපෘතිය අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 5 හි 43(අ) වගන්තියට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන සඳහා වත්කම් සහ බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කරන දිනයේ පවතින විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම් (Parity adjustments) සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි. | 2,651 | අනාගතයේදී ව්‍යාපෘති අවසන් කිරීමේ ගිණුම් සකස් කිරීමේදී මෙම ගැලපීම සලකා බලනු ලැබේ. | විනිමය ගැලපීම (Parity adjustments) මූල්‍ය ප්‍රකාශනයට ගෙන ආ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | වත්කම් 2022 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට පැවරිය යුතු වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව තිබුණද, එම වත්කම් 2023 ඔක්තෝබර් 31 වැනිදා වන විටත් අමාත්‍යාංශයට පවරා නොතිබුණි. | 5.20 | අවසන් කිරීමේ අදියරේදී සම්පූර්ණ වත්කම් පැවරීම තරමක් අපහසු වේ, කෙසේ වෙතත් අනාගතයේදී ව්‍යාපෘති අවසන් කිරීමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට පියවර ගනු ඇත.. | සියලුම ව්‍යාපෘති වත්කම් අදාළ ආයතන වෙත පැවරීමට වහා පියවර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අටක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබූ අතර නීතිමය නඩු වල වත්මන් තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | අධිකරණ තීන්දු අවසන් වන තුරු, අපට තහවුරු කිරීමට හැකියාවක් නැත. | අපේක්ෂිත අසම්භවයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | රු.මිලියන 277.19ක හිඟ බිල්පත් සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සපයා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් වගකීම අඩුවෙන් දක්වා තිබුණි | 277.19 | පිළිතුරු ලබා දී නැත. | හිඟ බිල්පත් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |

**2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| රු.මිලියන 18,364ක් වටිනා නිම කළ ව්‍යාපෘති 85ක් සහ රු.මිලියන 352ක් වටිනා නිම නොකළ ව්‍යාපෘති 02ක් ආයතන 20කට භාර දී තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘති රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විධිමත් ලෙස පවරාගෙන නොතිබුණි. තවද, භාරදුන් ව්‍යාපෘති එම ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ද කර තිබේද යන්න තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 18,364 | අදාල ආයතනවලින් භාරගැනීමේ සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ | අදාළ ආයතනවලින් තහවුරු කර ගැනීමට වහා පියවර ගත යුතුය. |

## 3 භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික කාර්යසාධනය

| සංරචකය | ප්‍රමාදය /විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| **01** | **සංරචක අංක 01. මහනුවර නගර සංවර්ධනය** | | |
| (අ) | මහනුවර නගරයේ ප්‍රවාහනය ශක්තිමත් කිරීමට සහ එය ආකර්ශනීය සංචාරක නගරයක් බවට පත් කිරීමට රු.මිලියන 8,070.40 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 62.08 ක මුදලක් ඇස්තමේන්තු කරන ලදී. එසේම 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 5,781.67 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, මෙම අංගය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බස් පර්යන්ත 3 ක් ඉදිකිරීම, දිගුකාලීන ප්‍රවාහන සැලැස්මක් සකස් කිරීම සහ පරිසර ප්‍රමිති, මඟී සුවපහසුව සහ ආරක්ෂිත ප්‍රමිතීන් සකස් කිරීම යන උප ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතියට නොහැකි වී තිබීම හේතුවෙන් මෙම සංරචකයෙන් අපේක්ෂිත අරමුණු සම්පූර්ණ කළ නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයක් වන මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය (KMTT) ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 10,500 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 202.99 ක මුදලක් වැය කර තිබුණි. ඊට අමතරව ඉඩම් අත්පත් කර ගැනීම සඳහාද රු.මිලියන 686.35 ක මුදලක් වැය කර තිබුණි. නමුත් සැලසුම් කළ පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හේතුවෙන් 2022 මැයි 31 වන දින ඉතිරි වැඩ කටයුතු කරගෙන යාමට ප්‍රවාහන හා මහාමාර්ග සංවර්ධන අමාත්‍යාංශයට භාර දී තිබුණි. | | |
| (ඇ) | මුල් අවස්ථාවේදී ගැටඹේ, නිට්ටාවල හා තැන්නේකුඹුර යන ප්‍රදේශවල බස් පර්තයන්ත 3ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමකින් තොරව මූලික අවස්ථාවේදී හඳුනා නොගත් බෝගම්බර, ටොරිංටන් ඔරලෝසු කණු බස් පර්යන්ත ඉදිකිරීම සදහා රු. මිලියන 276.54 ක් වියදම් කර තිබුණු අතර, මහනුවර දකුණ බස් ඩිපෝව ඉදිකිරීම සදහා රු.මිලියන 127.8 ක් වියදම් කර තිබුණි. | | |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 238ක් ද, නව දැව වැඩමුළු ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 113ක් ද වැය කර තිබූ අතර, එම කටයුතු අවසන් කර නොතිබුණු අතර රු.මිලියන 88.46 ක් වටිනා ඉතිරි වැඩ නිම කිරීම සඳහා ව්‍යාපෘති නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට පවරා තිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘතිය ආරම්භයේදී මහනුවර දිස්ත්‍රික්කයේ මාර්ග කිලෝමීටර් 25ක් සංවර්ධනය කිරීමට ව්‍යාපෘතිය හඳුනාගෙන තිබුණද විෂය පථය සංශෝධනය කිරීමෙන් පසු නිම කර තිබුණේ කිලෝමීටර් 9ක් පමණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.<br><br>(අ) පිටත සහ අභ්‍යන්තර අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම යටතේ කටුගස්තොට, ගොහාගොඩ, පේරාදෙණිය මාර්ග කිලෝමීටර් 7ක් වැඩිදියුණු කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘති සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ආ) කටුගස්තොට-මඩවල-බබරැල්ල මාර්ගය සහ ධර්මාශෝක මාවත වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා පිළිවෙළින් රු.මිලියන 1,614.96ක් සහ රු.මිලියන 796.43කට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට මෙම කොන්ත්‍රාත්තු සඳහා රු.මිලියන 907.16ක මුදලක් වැය කර තිබුණද, එම කටයුතු අවසන් නොකර අත්හිටුවා තිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ඊ) | සංරචකය 1.2 යටතේ අපජල කාණු පද්ධති පුනරුත්ථාපනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 18.6 කට සමාන රු.මිලියන 2,418 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම සංරචකය සඳහා රු.මිලියන 522.22 ක මුදලක් වැය කර තිබුණු අතර, අවසන් කරන ලද උපව්‍යාපෘති 4 ක් මහනුවර මහ නගර සභාවට භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br><br>(i) සංරචකය 1.2.1, 1.2.2 සහ 1.2.3 යටතේ ගැටඹේ ජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම, දංගොල්ල, හීරැස්සගල ජල සේවා ටැංකි ඉදිකිරීම, හීරැස්සගල ජල පොම්පාගාර දෙකක් ඉදිකිරීම, නාගස්තැන්න, පිරිස්වත්ත, දංගොල්ල ප්‍රදේශවල කුඩා ජල පොම්පාගාර 5ක් ඉදිකිරීම, ජල සම්පාදන මෘදුකාංග වැඩිදියුණු කිරීම යන උප ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ii) ව්‍යාපෘතිය මගින් ස්ථාන 4ක සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර තිබුණද, හීරැස්සගල සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය පමණක් ඉදිකර තිබුණු අතර, මාර්ග කිලෝමීටර් 30ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණද කිලෝමීටර් 13.73ක් පමණක් නිම කර තිබුණි. | | |
| (උ) | සංරචක අංක 1.3 යටතේ මහනුවර නගරයේ ප්‍රධාන ජලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 5.5කට සමාන රු.මිලියන 715ක් වෙන් කර තිබුණි. මහනුවර නගරයේ පැරණි අපද්‍රව්‍ය නළ පද්ධතිය මහවැලි ගඟට සම්බන්ධ කර තිබෙන අතර එම මැද ඇලේ පිහිටි අපජල නළ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. කෙසේ වෙතත් පෞද්ගලික අපද්‍රව්‍ය නල මාර්ගයට හරවා යවා ඇති බව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලයේදී නිරීක්ෂණය විය. ඒ අනුව, අපද්‍රව්‍ය බැහැර කිරීම නවතා ප්‍රධාන කාණු පද්ධතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා රු.මිලියන 2,351.9 ක වියදමින් උප ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කරන ලදී.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස අපද්‍රව්‍ය මෙම නළ මාර්ගවලට මුදාහැර අපද්‍රව්‍ය මහවැලි ගඟට මුදා හැරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ඇස්තමේන්තු මුදලට වඩා සියයට 229ක් වැය වී තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සංරචක අංක 1.4 යටතේ මහනුවර නගරය නාගරික වැඩිදියුණු කිරීම සඳහා උප සංරචක 06 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 24.05 කට සමාන රුපියල් මිලියන 3,126.50 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් උප සංරචක 06 න් සංරචක 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 2,202.71 ක මුදලක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.<br><br>(i) මෙම ව්‍යාපෘතිය යටතේ ඇ.ඩො. මිලියන 8.1ක වියදමින් මැද ඇල පැරණි තැපැල් කාර්යාල පුනර්ජීවන වැඩසටහන, ග්‍රිඩ් නගර පුනර්ජීවන වැඩසටහන, මහනුවර ප්‍රධාන සැලැස්ම සහ නිර්මාණය සහ අධීක්ෂණ සේවාව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් එම වැඩකටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ii) පුරවැසි හා සංස්කෘතික දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 5.5කට සමාන රු.මිලියන 715ක් වෙන් කර තිබුණද, ඒ යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 4න් එක් ක්‍රියාකාරකමක් පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1,633.63ක් හෙවත් සියයට 128ක් වැය කර තිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| **02.** | **සංරචකය 02- ගාල්ල නගරය සංවර්ධනය** | | |
| (අ) | ගාලු නගරයේ ජල ප්‍රවාහනය සහ ගංවතුර අවම කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 26.52 කට සමාන රු.මිලියන 3,447.60 ක් වෙන් කර තිබුණි. සංරචක අංක 2.1 යටතේ 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් රු.මිලියන 3,309.99 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ..<br><br>(i) මොරගොඩ ඇළ, මෝඩ ඇළ සහ හරස් ඇළ ප්‍රතිසංස්කරණය කිරීමෙන් ගාල්ල මහ නගර සභා සීමාවේ ගංවතුර තත්ත්වයන් අවම කිරීමට බලාපොරොත්තු වූ අතර ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 26.52ක් හෙවත් රුපියල් මිලියන 3,447.60ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, අපේක්ෂිත දුර මීටර් 4,250 ක දුරින් මීටර් 1,850 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණු අතර එම නිසා අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය අවසන් වී මාස 10ක් ගතවීමටත් පෙර 2023 ඔක්තෝම්බර් මාසයේදී ගාල්ල නගරයේ ඇති වූ ගංවතුර තත්ත්වයෙන් එය තවදුරටත් තහවුරු විය.<br><br>තවද, මොරගොඩ ඇළ සහ මෝඩ ඇළ නඩත්තු කිරීම පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. කෙසේ වෙතත්, එම දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත ගංවතුර පාලනය නිසි පරිදි සිදු නොවූ අතර රොන් මඩ එකතු වීම සහ ජලජ පැළෑටි එම ප්‍රදේශයේ බෝ වීම සිදු වෙමින් තිබුණි.<br><br>(ii) පාලම් ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 650ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, රු.මිලියන 841.92 ක වියදමින් මොරගොඩ ඇළ සහ මොඩ ඇළ ආශ්‍රිත පාලම් ඉදිකිරීමෙ වැඩ 08 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව පාලම් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 200ක් පමණ භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මූලික අදියරේදී මොරගොඩ ඇළ සහ මෝඩ ඇළ සම්බන්ධ පාලම් 03 ක් පමණක් හඳුනාගෙන තිබූ නමුත් ව්‍යාපෘතිය අවසන් වන විට පාලම් 08 ක් ඉදිකර තිබුණි.<br><br>(iii) ගාල්ල මහ නගර සභා ජලාපවහන ඉදිකිරීම් ව්‍යාපෘති 05ක් සඳහා රු.මිලියන 1,126.9ක් වෙන් කර තිබුණද, රු.මිලියන 672.1ක් වටිනා ව්‍යාපෘති 02ක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගාලු නගරයේ නාගරික වැඩිදියුණු කිරීම සඳහා සංරචක අංක 2.2 යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 16.88 කට සමාන රු.මිලියන 2,194.40 ක් වෙන්කර තිබුණු අතර ව්‍යාපෘතිය මගින් 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,626.36 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ..<br>(i) ගාලු නගරය සංවර්ධනය යටතේ සිටි සෙන්ටර් ප්‍රදේශය ද සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(ii) ගාලු නගර සංවර්ධනය යටතේ චීන කොටුව ප්‍රදේශය සංවර්ධනය කිරීමටද සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(iv) උපදේශන සමාගම විසින් මොරගොඩ ඇල ඉවුරේ ගංවතුර පාලන ස්ථාන අටක් හඳුනාගෙන තිබුණද, තෙත්බිම් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම සඳහා මෙම ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. ප්‍රදේශයේ පිහිටි ඉඩම් අත්පත්කර ගැනීමේ අධිකාරිය සමඟ ඇති ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් නොමැතිකම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අත්හිටුවා තිබුණි. ගාල්ල නගරයේ ගංවතුර පාලන මලාපවහන පද්ධති 16ක් ඉදිකිරීමේ කටයුතු ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු හේතුවෙන් ආරම්භ කර නොතිබුණි. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.<br><br>(v) ගාල්ල ධර්මපාල උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 270.85 ක මුදලක් වැය කර තිබුණු අතර, එය ව්‍යාපෘතියේ මූලික අදියරේදී හඳුනාගෙන නොතිබුණද, සංරචක අංක 2.2 යටතේ ඉදිකර තිබුණි. එම උද්‍යානයේ විදුලි ජනන යන්ත්‍රයක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුවක් සඳහා 2021 දෙසැම්බර් 17 වන දින පෞද්ගලික සමාගමක් සමඟ රු.මිලියන 2.39 ක ගිවිසුමක් අත්සන් කර ඇති අතර යන්ත්‍රය සපයා දින 28 ක් ඇතුළත සවි කිරීමට නියමිතව තිබූ නමුත් 2023 ජනවාරි 23 එම යන්ත්‍රය සපයා තිබුණි. කෙසේ වෙතත්, ගිවිසුම්ගත වටිනාකමට යන්ත්‍රය සැපයීමට නොහැකි වූ බැවින්, සැපයුම්කරු විසින් රු.මිලියන 4.53 ක සංශෝධිත මුදලක් ඉදිරිපත් කර තිබුණි. මිල විචලනය සියයට 93ක් පමණ වූ අතර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ප්‍රසම්පාදන කමිටුවේ එක් සාමාජිකයෙකුගේ එකඟතාවය මත පමණක් ලබාදී තිබුණු අතර සංශෝධිත ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. එය විගණනයේදී ගැටලු සහගත විය. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| **03** | **සංරචකය 04- යාපනය නගරය සංවර්ධනය** | | |
| (අ) | සංරචකය 4.1 හි පරමාර්ථය වූයේ යාපනය නගරයේ රථවාහන කළමනාකරණය සහ පොදු ප්‍රවාහනය වැඩිදියුණු කිරීම වන අතර ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 15.50 කට සමාන රු.මිලියන 2,299.73 ක් (2016.12.31 දින විනිමය අනුපාතිකයට අනුව) වෙන් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2,383.70 ක මුදලක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>(i) සංරචක අංක 4.1.1 යටතේ පේදුරුතුඩුව සිට කොඩිකාමම් දක්වා කිලෝමීටර් 14ක් සහ යාපනයේ සිට පොන්නයි දක්වා කිලෝමීටර් 16ක් සංවර්ධනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 15.20කට සමාන රු.මිලියන 2,255ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් යාපනයේ සිට පොන්නයි දක්වා කොටස සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 893.45ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතිය අවසානයේ වැඩ නිම කර නොතිබුණි.<br><br>තවද 2023 ජූනි 14 දින අමාත්‍යාංශය විසින් රු.මිලියන 13.69 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති බව නිරීක්ෂණය විය. එම බිල්පතෙන් දින 61 ක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 43.27 ක මුදලක් අඩු කර තිබුණි. කෙසේ වෙතත්, වැඩ අවසන් කිරීමේ සහතිකයට අනුව දින 296ක් සඳහා ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 210ක මුදලක් අය කළ යුතුව තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතියට රු.මිලියන 166.72 ක පාඩුවක් සිදු වී තිබුණි.<br>(ii) යාපනය නගරය සඳහා රථවාහන කළමනාකරණය සහ පොදු ප්‍රවාහනය සඳහා සැලසුම් සකස් කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 0.30කට සමාන රු.මිලියන 44.51ක් වෙන් කර තිබුණද, 4.1.2 සංරචකය යටතේ එම කටයුතු සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යාපනය නගරයේ ජලාපවහන පද්ධති වැඩිදියුණු කිරීම සංරචකය 4.2 අරමුණු වී තිබුණු අතර ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 21.5 කට සමාන රු.මිලියන 3,189.95 ක් වෙන් කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් රු.මිලියන 223.08 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.<br>(i) සංරචක අංක 4.2.3, 4.2.4, 4.2.5, 4.2.6 යටතේ සැලසුම් සහ අධීක්ෂණ සේවාව, ජලාපවහන ප්‍රධාන සැලැස්ම සහ ප්‍රමුඛතා ආයෝජනවල සවිස්තරාත්මක සැලසුම, ජලාපවහන ප්‍රධාන සැලැස්ම යටතේ තෝරාගත් ප්‍රමුඛතා ආයෝජන, ජලාපවහන ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා උපකරණ ආදී කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 11.9 කට සමාන රු.මිලියන 1,766 ක් වෙන් කර තිබුණද, එම කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.<br>(ii) පවතින කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4.80කට සමාන රු.මිලියන 712ක් වෙන් කර රු.මිලියන 82.85ක් වැය කර තිබුණද, සංරචක අංක 4.2.1 යටතේ සංවර්ධනය කර තිබුණේ කාණු පද්ධති 4ක් පමණි.<br>(iii) සංරචක අංක 4.2.2 යටතේ පොකුණු ඉවුරු සංරක්ෂණය සහ රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4.5 කට සමාන රු.මිලියන 668 ක් වෙන් කර තිබුණි. නමුත් රු.මිලියන 141ක මුදලක් වැය කර ව්‍යාපෘතිය අවසානයේ නිම කර තිබුණේ එක් උප ව්‍යාපෘතියක් පමණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ඇ) | සංරචක 4.3 යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 21.9 කට සමාන රු.මිලියන 3,249 ක් වෙන් කර තිබුණු අතර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් රු.මිලියන 183.95 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>(i) සංරචක අංක 4.3.4 යටතේ නාගරික විනෝදාශ්වාද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4.8 කට සමාන රු.මිලියන 712 ක මුදලක් වෙන් කර තිබුණි. රු.මිලියන 84.90 ක මුදලක් වැය කර තිබුණද, යාපනයේ නාගරික උද්‍යානය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු -. අදියර 2 (පාසයූර් උද්‍යානය) 2022 දෙසැම්බර් 31 වන විටද නිම කර නොතිබුණි<br>(ii) සංරචක අංක 4.3.1- සංස්කෘතික උරුමය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 4.8, සංරචක අංක 4.3.2 - නාගරික වීදි සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 4.5, සංරචක අංක 4.3.3 - සංචලනය වැඩි දියුණු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 2.7, යාපනය නගර ප්‍රදේශය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක් සහ සංරචකය අංක 4.3.7 සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 15.4ක් වෙන් කර තිබු නමුත් ව්‍යාපෘතිය අවසාන කරන විට එම ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ඈ) | සංරචකය අංක 4.4 යටතේ ධාරිතා ගොඩනැගීම සඳහා යාපනය මහ නගර සභාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.05ක් හෙවත් රුපියල් මිලියන 304ක් වෙන් කර තිබුණද ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද 2022/06/10 දිනැති මෙම නිරීක්ෂණ ක්‍රියාත්මක කිරීමේ සම්පූර්ණ වාර්තාව සහ 2022 අගෝස්තු මස ලෝක බැංකු ක්‍රියාවට නැංවීමේ සම්පූර්ණ වාර්තාවන් මගින් පැහැදිලිව පෙන්වා දී ඇත. | පොදු ජනතාවට අපේක්ෂිත අරමුණු සහ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති කාල සීමාව තුළ ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |

## 3.2 එල රහිත වියදම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාත්මක කිරීමේ අපහසුතා හේතුවෙන් ගාල්ල නගරයේ ගංවතුර පාලනය කිරීමේ කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන්, නිර්මාණය හා ඉදිකිරීම සඳහා උපදේශකවරයාට ගෙවා තිබූ රු.මිලියන 21.49 ක මුදල එල රහිත වියදමක් වී තිබුණි. | මෙම උපදේශන කොන්ත්‍රාත්තුව ඇගැයීම් සැලසුම් කිරීම සහ ඇළ මාර්ග වැඩිදියුණු කිරීම හරහා ගංවතුර අවම කිරීම ඉදිකිරීම සඳහා වන අතර විවිධ හේතූන් නිසා සමහර ඇළවල් අතහැර දමා ඇත. | ණය අරමුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුවේ. |